# 2023 ජනවාරි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2023 ජනවාරි මස මාසික සභා රැස්වීම 2023.01.12 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී - වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.එච්.ඒ.කරුණාරත්න මිය
2. කළමනාකරණ සේවා නිලධාරී - පී.කේ.ඩී.සී.කුමාරි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2022.12.15 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.අසිත ප්‍රසාද් මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 2.ගරු සභාපතිතුමාගේ නිවේදන

### 2.1. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

- එස්.ඒ.අමරදාස නමින් ඇති අංක NG-547 දරණ ජල බිල්පත ඒ.ඒ.ධනේෂ් රසික ලසන්ත නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## 3.සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින් ,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

### 3.2. බැකෝ යන්ත්‍රයේ සහය ලබා ගැනීම.

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ගල්ගොඩගම ග්‍රාම නිලධාරී වසමෙහි හේන්යාය,වැලිගෙපොල ලිපිනයෙහි පදිංචි ටී.එච්.සුනිල් වීරසිංහ යන අයගේ නිවස දෙසට වර්ෂා කාල වලදී නිරන්තරයෙන් යාබද ඉවුරෙන් පස් කණ්ඩි කඩා වැටීම පිළිබඳ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් කරන ලද ස්ථානීය පරීක්ෂණයකට අනුව මෙම නිවස පිහිටිස්ථානය මධ්‍ය අවධානම් සහිත බව වාර්තා කර ඇති අතර එම NBRO වාර්තාව මඟින් මෙම අවධානම් තත්වය අවම කර ගැනීමට උපදෙස් දී ඇති බවත් ඒ සඳහා ආර්ථික ශක්තියක් ඔවුනට නොමැති හෙයින් ඉවුර කපා ඉවත් කර ගැනීමට බැකෝ යන්ත්‍රයක සහය ලබා දෙන ලෙස ඉල්ලා වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම්තුමා මඟින් දන්වා එවා තිබූ ලිපිය සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### 3.3. වැලිගෙපොල පොලිස් ස්ථානයේ පිවිසුම් මාර්ගය සකසා ගැනීම

වැලිගෙපොල පොලිස් ස්ථානයට ප්‍රවේශ වීමට ඇති මීටර් 150 ක් පමණ දිග මාර්ගය මේ වන විට අබලන්ව ඇති බැවින් එයට ABC ගල් අතුරා ගල් රෝලකින් තලා තාර ප්‍රමාණයක් වත්කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීම් කර එවා තිබූ ලිපිය සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපති තුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### 3.4. වැලිගෙපොල පොලිස් භූමිය සකස් කර ගැනීම සඳහා JCB යන්ත්‍රය ලබා ගැනීම

වැලිගෙපොල පොලිස් ස්ථානය මේ වන විට පෙරසවි ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලබන අතර එහි රාජකාරි නිරත නිලධාරීන්ට කිසිඳු පහසුකමක් නොමැති වීම නිසා නව හට නිවාස දෙකක් සකසා ගැනීමට කටයුතු සිදුකරමින් පවතින හෙයින් නිලධාරීන්ගේ ප්‍රයෝජනයට ගැනීමට පෙළපාලි පිටියක් සහ හට නිවාස 02 ක් සකසා ගැනීමට අවශ්‍ය බිම සකස් කර ගැනීම සඳහා අප ආයතනයේ ජේ.සී.බී. යන්ත්‍රය එක් දිනක් සඳහා  ලබා දෙන මෙන් ඉල්ලා එවා තිබූ ලිපිය සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපති තුමා විසින් ඉදිරිපත් කරන ලදි.

## 4.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5.කල් දී ඇති යෝජනා

### 5.1 ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදි.

i. කසල මධ්‍යස්ථානය සඳහා කම්කරුවන් තුන් දෙනකු බඳවා ගැනීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැන්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා, මෙම කසල මධ්‍යස්ථානය සඳහා කම්කරුවන්, බහු කාර්යය පත්වීම් වලින් බඳවා ගත හැකිද යන්න විමසුවේය.

ඊට අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, කම්කරුවන් දෙදෙනකු විශ්‍රාම ගොස් ඇති බැවින් බල ප්‍රදේශය තුල කසල බැහැර කිරීම අපහසු වී ඇති බව හා බහු කාර්යය පත්වීම් වලින් සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා අනුයුක්ත කර නොමැති බවත් ඔවුන් කසල මධ්‍යස්ථානය, හෙල බොජුන්හල ,ජල ව්‍යාපෘති හා කාර්යාල මුරු සේවය ආදීන්ට යොදවා ඇති බවද පැවසුවේය.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ii. පූර්ව ළමාවිය සංවර්ධනය සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම වෙනුවෙන් ලැබී ඇති රු:1,425,560.38 ක මුදල ගෙවීමට අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී රණතුංග මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

iii. ඉන්ධන මිල ඉහල යාමත් සමඟ සී/ස පන්නිල්පත්තු විවිධ සේවා සමුපකාර සමිතිය මඟින් ඉන්ධන ලබා ගැනීම සඳහා තබා ඇති රු:200,000.00 ක ඇප තැන්පතුව ප්‍රමානවත් නොවන බැවින් එය රු:500.000.00 දක්වා වැඩි කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සී ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

iv. ඕපනායක මහජන පුස්තකාලයේ නව නිපැයුම් අංශයේ එක් නව නිපැයුමකට අය කර ගන්නා රු:575.00 ගාස්තුවෙන් කොටසක් පමණක් සිසුවකුගෙන් අය කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ් සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ,බොහෝ සිසුන් එම නව නිපැයුම් අංශ හා සම්බන්ධ වීමට බලා පොරොත්තුවෙන් සිටින නමුත් ආර්ථික අපහසුතා නිසා සමහර දරුවන්ට මෙම අවස්ථාව අහිමි වන බැවින් ඒ වෙනුවෙන් මෙම තීරණය ගත් බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් පැහැදිලි කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

v. රු:250,000.00 දක්වා වූ කාර්යාලීය ප්‍රසම්පාදන කමිටුව ලෙස ,ගරු සභාපති,ලේකම්,කාර්මික නිලධාරී,ප්‍රධාන සංවර්ධන නිලධාරී,අංශ ප්‍රධානීන්,පුස්තකාලයාධිපති සහ ආයුර්වේද වෛද්‍ය නිලධාරී,පත් කිරීම සුදුසු බවට ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සී.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

vi. පහත පරිදි සංවර්ධන උපදේශන කාරක සභා පිහිටුවීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදි.

- ශාසනාරක්ෂක බල මණ්ඩලය නියෝජනය කරමින් ,
  - පූජ්‍ය පනානේ විජයවංශ හිමි,
  - පූජ්‍ය මාදොළ සෞගත හිමි,

- පූජ්‍ය හටංගල දම්මවංශ හිමි.
- පූජ්‍ය මොරහැල උත්තරානන්ද හිමි.

- ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා
- ර/විද්‍යාකර ඉසුරු මහ විද්‍යාලයේ විදුහල්පති උපුල් වතුකාරවත්ත මයා
- ර/ධර්මරාජ මහ විද්‍යාලයේ විදුහල්පති එන්.කේ.හෙට්ටිආරච්චි මයා
- ර/වලගම්භා විද්‍යාලයේ විදුහල්පති ආනන්ද සමරකෝන් මයා
- ර/අම්බැවිල විද්‍යාලයේ විදුහල්පති සනත් නන්දසිරි මයා
- ව්‍යාපාරික ගාමිණී වෙල්ලාල මයා
- ගොවිජන සමිති නියෝජනය කරමින් එම්.ජී.පත්මලාල් උදයසිරි මයා

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොටුව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සහා සම්මත විය.

vii. වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ කාර්ය හා කර්තව්‍යයන් ට අදාලව රු.50,000.00 සිට රු.500,000.00 දක්වා වූ සියලු වියදම් අනුමත කිරීම ,රු.50,000.00 සිට රු.500,000.00 දක්වා ඇස්තමේන්තු අනුමත කිරීම ,ගරු සභාපතිවරයා විසින් සිදු කරනු ලබන රු.50,000.00 දක්වා වූ වියදම් සඳහා ආවරණ අනුමැතිය ලබා දීම,නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව,කාර්මික සේවා කමිටුව සහ පරිසරය හා පහසුකම් කමිටුව නිර්දේශ කරනු ලබන රු.50,000.00 සිට රු.500,000.00 දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබා දීම ,රු.500,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියා කිරීම ,ප්‍රාදේශීය සභා පනත/ රාජයේ විවිධ රෙගුලාසි /චක්‍රලේඛ/අතුරු ව්‍යස්ථා හා රීතීන් වලට අනුකූල වන පරිදි ආදායම් ඒකරාශි කිරීම,වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වගවීම සහ පාලනය කිරීම,මූල්‍ය ස්ථාවරත්වය ගොඩනැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා මුදල් කමිටුවට බලය පැවරීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සහා සම්මත විය.

viii. අවස්ථානුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම සඳහා ගරු සභාපතිතුමාට බලය පැවරීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සහා සම්මත විය.

ix. හෙල බොජුන්හල ආදායමින්, 7% දක්වා වැඩිකර අයකර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා,මෙය 2023 පෙබරවාරි මස පළමුවන දින සිට ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් මෙහිදී බොජුන්හලේ විදුලි බිල්පත සභාව මගින් දැරීම සුදුසු බවටද යෝජනා කළ අතර එම යෝජනාව ගරු ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

## 6.කාරක සභා වාර්තා සලකා බැලීම.

### 6.1.මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා

2022.11.24,2022.12.15,2022.12.20 හා 2023.01.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 6.2.ප්‍රසම්පාදන වාර්තා

2022.10.17,2022.10.26,2022.11.10,2022.11.15 හා 2022.12.09 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තා මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7.ආදායම් වියදම් වාර්තා

## 7.1.2022 නොවැම්බර් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 866,211.94 | වැටුප් හා දීමනා | 4,364,881.21 |
| කුලී | 567,267.55 | ගමන් වියදම් | 15,630.00 |
| බලපත්‍ර ගාස්තු | 9,000.00 | සැපයුම් හා උපකරණ | 1,672,656.75 |
| සේවා සඳහා ගාස්තු | 154,659.00 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා | 436,226.00 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 497,550.00 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 311,593.27 |
| වෙනත් ආදායම් | 166,71.56 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 3,922,829.68 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 6,034,189.73 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 49,764.80 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්ථන වියදම් එකතුව | 6,850,752.03 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 774,200.00 |
| පුනරාවර්ථන/ප්‍රාග්ධන ආදායම් එකතුව | 6,034,189.73 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 132,414.67 | සේවක ණය | - |
| තැන්පත් | 230,204.75 | තැන්පත් | 179,925.43 |
| අත්තිකාරම් | 119,450.00 | ණය හිමි | - |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 178,000.00 |
| සමුච්චිත අරමුදල | 73,529.41 | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| වෙනත් ලැබීම් එකතුව | 555,598.83 | සමුච්චිත අරමුදල | 24.99 |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 357,950.42 |
| මුලු එකතුව | 6,589,788.56 | මුළු ගෙවීම් | 7,982,902.45 |

7.2. 2022 නොවැම්බර් 30 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 01 යා කර ඇත.

## 8.පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමු කර ඇති බව, ප්‍රකාශ කරන ලදි.

## 9.වෙනත් කරුණු

### 9.1ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල් ලාල් කුමාර රත්න මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල් ලාල් කුමාර රත්න මැතිතුමා,හදගිරිය කොට්ඨාශයේ වන අලි කිහිප දෙනෙකු ගම් වැදී සිටියදී අලි වැට සවි කර ඇති නිසා ප්‍රදේශවාසී ජනතාව මහත් සේ පීඩාවට පත් වී ඇති බව හා කුඹුරු සියල්ල විනාශ වී යාමේ ගැටළුව පිළිබඳව පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණයේ සහ වනජීවී දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කලද අලි ඩොන් නොමැති වීම නිසා මෙම ගැටළුව විසඳීමට නොහැකි වී ඇති බව ඔවුන් පවසන නමුදු තවත් ජීවිතයක් බිලි ගැනීමට පෙර මෙම ගැටළුව විසදා ගැනීමට අලි ඩොන් 300 ලබා ගැනීම සඳහා වනජීවී අමාත්‍යාංශය වෙත ලිපි යොමු කරන ලෙස ඉල්ලා සිටියේය.

තවද තිත්තවැල් කුණ්ඩිය ගොවීන්ගේ ඉඩම් ගැටළුව නිරාකරණය වූ බවත් ඒ සම්බන්ධව පසුගිය සභා වාරයකදී සාකච්ඡා කළ හෙයින් අවශ්‍ය ස්ථාන කරා ලිපි යොමු කර සහයෝගය ලබා දීම සම්බන්ධව සහ බෙලිමාලියද්ද ප්‍රදේශයට මොබිටෙල් සම්ප්‍රේෂණ කුළුනක් ලබා ගැනීම සම්බන්ධවද අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව සිය ස්තුතිය පළ කරන බව ප්‍රකාශ කළේය.

තවද කපුගල මාර්ගයේ අතු කපා ඉවත් කර දෙන ලෙසත් ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා මෙම ආර්ථික අපහසුතා ඇති කාලය තුල ඡන්දයක් පැවැත්වීම නොව එම මුදල් යොදවා ජනතාවගේ ප්‍රශ්න විසඳීම සුදුසු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

### **9.2** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ ඩබ්.කුමාර මැතිතුමා

යටිපස්ගමුව මාර්ගයේ ප්‍රශ්නය පිළිබඳව ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා විසින් කරුණු විමසුවේය.

### **9.3** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය යටිපස්ගමුව මාර්ගයේ අනතුරුදායක ගස් කපා ඉවත් කිරීමට ප්‍රමුඛතාවය දී කටයුතු කරන ලෙස ඉල්ලා සිටියාය.

### සභා රැස්වීමේ නිමාව

මෙම වර්ෂයේ ඉදිරි කාලය තුල දේශපාලන වාතාවරණය කෙසේවේදැයි නොදන්නා නමුත් මේ වන තෙක් කරගෙන ආ සියළු වැඩ කටයුතු ඒ ආකාරයෙන් කරගෙන යන බව පැවසූ ගරු සභාපති තුමා,ලැබුවාවූ 2023 වර්ෂය සැමටම සෞභාග්‍යවත් සුභ නව වසරක් වේවා! යැයි පතමින් දහවල් 12 පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.